**23-06-2022 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මේ ලෝකයේ තිබෙන්නා වූ මිලියන හා බිලියන ගණන් වලින් ඔබට කිසිම ප්‍රයෝජනයක් නොමැත. සෑම දෙයක්ම දූහුවිල්ලක් බවට පත්වීමටයි යන්නේ. එමනිසා, දැන් සත්‍යයේ දේශය උදෙසා ආදායමක් උපයා ගන්න.

**ප්‍රශ්නය:** බ්‍රහමින් දරුවන් වන ඔබ දේවතාවන්ට වඩා උසස් ලෙස සැළකෙන්නේ කුමන කරුණක් හේතුවෙන්ද?

**පිළිතුර:** බ්‍රහමින් දරුවන් වන අප මෙකල සෑම කෙනෙකුටම ආධ්‍යාත්මික ලෙස සේවය කරනවා. අපි සෑම ජීවයකටම පියා, ඒ උත්තරීතර ජීවය මුණ ගැසීමට සළසනවා. දේවතාවන් මෙම මහජන සේවයෙහි යෙදෙන්නේ නැහැ. එහිදී, රජවරුන් හා රැජිණියන් කෙලෙසද, එලෙසටයි සේවකයන් එහිදී ඔබ තමා මේ කාලයේදී දරන්නා වූ උත්සාහයේ ඵලය ලබා ගන්නවා. එහිදී, ඔබ සේවය කරන්නේ නැහැ. මේ නිසා තමයි සේවයෙහි යෙදෙන්නා වූ බ්‍රහමින් දරුවන් වන ඔබ දේවතාවන්ටත් වඩා උසස් වන්නේ.

ඕම් ශාන්ති. මෙම රැස්වීම කාගේද? ජීවී මනුෂ්‍යයින්ගේත්, උත්තරීතර ජීවයත් අතර සිදුවන හමුවීමයි. ශරීරයක් තියෙනා අය හඳුන්වන්නේ පණ ඇති කෙනෙක් ලෙසයි. ජීවාත්ම උත්තරීතර ජීවාත්මයෙන් බොහෝ කාලයක් තිස්සේ ඈත් වී සිටියා. නැකැත් බරින් පිරි හමුව ලෙස හඳුන්වන්නේ මෙයයි. උත්තරීතර පියා, උත්තරීතර ජීවය සජීවී මනුෂ්‍යයෙක් ලෙස හැඳින්වීමට නොහැකි බව දරුවන් දන්නවා. මන්ද, ඔහු ශරීරයක් ණයට ගන්නා නිසයි. ඔහු ශරිරයක සහාය ලබා ගන්නවා. ඔහුම පැමිණ මෙසේ කියනවා දරුවනි, මමත් මේ පදාර්ථවල සහාය ලබා ගත යුතු වෙනවා. මම මව් ගර්භාෂයකට ඇතුළු වන්නේ නැහැ. මා මොහු තුළට ඇතුළු වී ඔබට විස්තර කරනවා. මනුෂ්‍යයින් වන ඔබට ඔබගේ ශරීර තිබෙනවා. මට මටම කියා ශරීරයක් ඇත්තේ නැහැ. එමනිසා, මෙය අසහාය වූ හමුවකි. මෙහි ගුරු ගෝලයින් හෝ අනුගාමිකයින් නැහැ. නැහැ. මෙය පාසලකි. තමාගේ ගුරු ගිය පසු තමාගේ ගදි එක (සිහසුන) ලැබෙනවා කියා මෙහි දෙයක් නැහැ. ගදි පිළිබඳව මෙහි ප්‍රශ්නයක් නැඟෙන්නේ නැහැ. තමාට උගන්වන්නේ කවුද යන්න ගැන දරුවන්ට පැහැදිලි විශ්වාසය තිබෙනවා. ශ්‍රද්ධා විශ්වාසය නොමැති කිසිම කෙනෙක්ට මෙහි පැමිණිය නොහැකියි. මනුෂ්‍යයින්ගේ වංශය වන්නේ බ්‍රහ්මින් වංශයයි. මන්ද, ඒ උත්තරීතර පියා, උත්තරීතර ජීවය බ්‍රහ්මා මාර්ගයෙන් නිර්මාණය සිදුකරනා නිසයි. සෑමටම වඩා උසස් වූත්, දේවතාවන්ටත් වඩා උසස් වූ අය වන්නේ බ්‍රහමින් දරුවන් වන ඔබ බව ඔබ දන්නවා. දේවතාවන් මහජනයාට සේවය කරන්නේ නැහැ. එහිදී, රජ හා රැජිණ වගේ තමයි පුරවැසියන්. එහිදී, ඔවුන් දරණ ලද උත්සාහය අනුව ඔවුන් තම තිළිණය හිමිකර ගන්නවා. ඒ කිසිම කෙනෙක් සේවය කරන්නේ නැහැ. සේවය කරන්නේ බ්‍රහමින් දරුවන්. දරුවන් දන්නවා මීට අවුරුදු 5000කට ප්‍රථම සිදු වූ සේම, ඔබ පියාත් සමඟ රාජයෝගා ඉගෙන ගන්නා බව. ඔබලා දරුවන් මෙහි අනුගාමිකයින් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. පියා නැවත නැවතත් ඔබට ‘දරුවනි‘ යනුවෙන් අමතා ඔබට විස්තර කර දෙනවා. ඔබ දැන් ජීවාත්ම අවධානයට පත්ව සිටිනවා. ජීවාත්මය අවිනාශී වූවක් වන අතර ශරීරය විනාශ වන සුළුය. ශරීරය හඳුන්වන්නේ ඇඳුම් ආයිත්තමක් ලෙසයි. මේවා කිලිටි වූ ඇඳුම්. මන්ද, ජීවාත්ම යක්ෂ උපදෙස් අනුගමනය කර පාපයේ යෙදී අපිරිසිඳු බවට පත්ව සිටිනවා. ‘පාරිශුද්ධත්වය‘ හා ‘අපිරිසිඳු‘ යන වචන මතුවන්නේ පාපය නිසයි. පියා කියනවා දැන් තවදුරටත් අපිරිසිඳු බවට පත්වන්න එපා. මෙය රාවණ්ගේ රාජ්‍යය නිසා දැන් සෑම කෙනෙක්ම රාවණ්ගේ යදම් අතර සිර වී සිටිනවා. එමනිසා, පියා ඔබව රාවණ්ගේ රාජ්‍යයෙන් මුදවාගෙන ගොස් රාමාගේ රාජ්‍යය වෙත ගෙන යනවා. ඔවුන් කියනවා දෙවියන්, පියා තමයි විමුක්තිදායකයා. ඔහු කියනවා මා සෑම කෙනෙක්ම දුකින් මුදවාගෙන ඔවුන්ව සාමයේ දේශය වෙත ගෙන යනවා. දරුවන් එහි ගොස් නැවත අලුත්පිට පැමිණ නැවතත් ඔබගේ චරිත කොටස රඟ දක්වනවා. දේවතාවන් පළමුවෙන්ම තම චරිත කොටස නැවතත් සිදු කළ යුතු වෙනවා. ඔවුන් සිටියේ මුලදීයි. එනම්, දැන් බ්‍රහ්මා මාර්ගයෙන් ඒ ආදී සනාතන දේවී දේවතා ධර්මය ස්ථාපනය වෙමින් පවතිනවා යන්නයි. කලි යුගයේ විනාශය දැන් ඔබ ඉදිරියේමයි. මිනිස්සු දැන් ඉන්නේ සම්පූර්ණයෙන්ම අඳුරේයි. ඔවුන් ලක්ෂපතියන්, කෝටිපතියන්. ඒ වගේම රාවණ්ගේත් සැහෙන සැරසිලි තිබෙනවා ඔවුන් ඒ සමඟ ආකර්ෂණය වී තිබෙනවා. පියා විස්තර කරනවා ඒ සෑම දෙයක්ම දූහුවිල්ලක් බවට පත්වෙන්නා වූ බොරු ආදායමක් පමණයි. ඔවුන්ට කිසිම දෙයක් ලබා ගැනීමට නොහැකි වෙනවා. ඔබ තමාගේ අනාගත උපත් 21ක් උදෙසා ඔබගේ උරුමය ලබා ගැනීම සඳහා

පැමිණ සිටිනවා. සත්‍යයේ දේශය සඳහා වූ නියම ආදායම මෙයයි. සැම කෙනෙක්ම නිවස වෙත යා යුතු වෙනවා. මෙය සැමගේ විශ්‍රාම යන අවදියයි. පියා කියනවා සැමට ගැලවීම ලබා දෙන්නා වූත්, සැමගේ සත්ගුරු වන්නේත් මමයි. මා පූජකවරුන් සහ අපිරිසිඳු වූවන් පවා අභිවෘද්ධියට පත්කරවාලනවා. පුංචි දරුවන්ට පවා ශිව බාබා සිහිපත් කිරීමට ඉගැන්වෙනවා. අනෙක් සැම දෙයක්ම දැන් විසිකර දමන්න ඒ එකම එක ශිව බාබා හැර වෙන කිසිම කෙනෙක් සිහිපත් කරන්න එපා! ඔබ දන්නවා පියාගෙන් ඔබගේ අසීමිත වූ සතුටේ උරුමය ලබා ගැනීමට ඔබ නැවතත් පැමිණ සිටිනා බව. උපතක් උපතක් පාසා ඔබ සීමිත වූ පියාගෙන් සීමිත උරුමයක් ලබා ගත්තා. රාවණ්ගේ යක්ෂ උපදෙස් අනුගමනය කිරිමෙන් ඔබ දිගින් දිගටම අපිරිසිඳු බවට පත් වූවා. මනුෂ්‍යයින්ට මේවා වැටහෙන්නේ නැහැ. ඔවුන් රාවණ් පුළුස්සනවා. එමනිසා, ඔහු පිළිස්සී ගොස් මිය යා යුතුයි. මළ මිනියක් පිළිස්සෙන විට, එහි නම හා ස්වරූපය ආදී සියලු දේ විනාශ වී යනවා. කොහොමනමුත්, රාවණ්ගේ නම හා ස්වරූපය කිසිම විටෙක නැති වී යන්නේ නැහැ ඔවුන් නැවත නැවතත් ඔහුව පුළුස්සා දමනවා. පියා කියනවා ඒ තමයි රාවණ්, පාප පහ. ඔවුන් උපත් 63 ක් තිස්සේ ඔබගේ සතුරා වී සිටියා. භාරතයේ සතුරෙක් යනු ඔබේ සතුරා වනවා. ඔබ පාප මාර්ගය අනුගමනය කිරීමට පටන්ගත් පසුව ඔබ රාවණ්ගේ සිර කුටියට වැටුණා. කල්ප භාගයක් පුරා මෙය රාවණ්ගේ රාජ්‍යය ලෙස තිබුණා. රාවණ් පිළිස්සී යන්නේ නැහැ, මිය යන්නේත් නැහැ. රාවණ්ගේ රාජ්‍යයේ ඔබ දැන් බොහෝ අසතුටට පත්ව සිටිනා බව ඔබ දැන් දන්නවා. මෙය සතුට හා දුක පිළිබඳ වූ නාට්‍යයකි. මායාට පැරදෙන අය සියලු දෙයින් පැරදෙන බවත්, මායාව පරාජය කරන අය සැම දෙයක්ම පරාජය කර දමනා බව කියැවෙනවා. ඔබ දැන් මායා පරාජය කොට ජය ගන්නා අතර නැවත වතාවක් රාමාගේ රාජ්‍යය ලබා ගන්නවා. රාමා හා සීතාගේ රාජධානිය තිබෙන්නේ රිදී යුගයේයි. ලක්ෂ්මි හා නාරායනගේ රාජධානිය තිබෙන්නේ සත් යුගයේයි. එහි තිබෙන්නේ ආදී සනාතන දේවී දේවතා ධර්මය වන අතර එය හැඳින්වෙන්නේ පරම පියා විසින් ස්ථාපනය කරනු ලැබුවා වූ දේව රාජ්‍යය ලෙසයි. පියා සැම තැනම සිටිනවා කියා කිසිම විටෙක පැවසිය නොහැකියි මන්ද, එය සහෝදරත්වයක්. එකම පියා පමණයි, ඔබ සැම කෙනෙක්ම සහෝදරයින්. පියා මෙහි අසුන්ගෙන ජීවාත්මයනට උගන්වනවා. පියාගේ අවවාදය වන්නේ මා සිහිපත් කරන්න! මා පැමිණ සිටින්නේ ඔබ කළ භක්තියෙහි ඵලය ලබා දීම සඳහායි. කාටද? භක්තිය පටන් ගත් දා සිට, එහි මුල සිට අග දක්වාම භක්තියේ යෙදුණු අයටයි. මුලදී ඔබ වන්දනා කළේ ශිව බාබාට පමණයි. සෝමනාථ කෝවිල කෙතරම් උතුම්ද (අමෘතයේ ස්වාමියා)! ඔබ කෙතරම් ධනවත්ව සිටියාද බලන්න. ඔබ දැන් බෙලි කටුවක් තරම් නොවටිනා තත්ත්වයේ දිළින්දන් බවට පත්ව සිටිනවා. ඔබට දැන් උපත් 84ක සිදු වූ සියලුම දේ බුද්ධිය තුළ තිබෙනවා. තමා සිටි තත්ත්වයෙන් දැන් ඔබ කුමන තත්ත්වයකට පත්ව සිටිනවා ද යන්න ගැන ඔබ දැන් දන්නවා. ඔබට දැන් සැම දෙයක්ම නැවතත් සිහිපත් වී තිබෙනවා. 'ආකල්පයන්ගේ ප්‍රතිමූර්තිය' (ස්මෘති ලබ්දා) යන වචන ස්වල්පය අයත් වන්නේ මෙම කාලයටයි. කොහොමනමුත්, දෙවියන් පැමිණ සංස්කෘත භාෂාවෙන් ගීතාව කිව්වා කියා මෙයින් අදහස් වන්නේ නැහැ. එය සංස්කෘත භාෂාවෙන් තිබුණේ නම් දරුවන්ට කිසිම දෙයක් තේරුම් ගැනීමට නොහැකි වනවා. ප්‍රධාන භාෂාව වන්නේ හින්දි භාෂාවයි. ඔහු ඔබට විස්තර කරන්නේ බ්‍රහ්මාගේ භාෂාවෙනි. සැම චක්‍රයකදීම ඔහු එම භාෂාවෙන් උගන්වනවා. තමා දැන් බාප්දාදා ඉදිරියේ අසුන් ගෙන සිටිනා බව දරුවන් දැන් දන්නවා. මෙය පවුලක්, මමා, බාබා, සහෝදර සහෝදරියන් පමණයි මෙහි ඉන්නේ. එපමණයි. මෙහි වෙන කිසිම සබඳතාවක් නැහැ. ප්‍රජාපිතා බ්‍රහ්මාට අයත් වන විට ඔබ සහෝදර සහෝදරියන්. එසේ නැති නම් ජීවාත්ම ලෙස ගත් කල ඔබ සැම කෙනෙක්ම සහෝදරයින්. ඔබ පියාගෙන් ඔබගේ උරුමය ලබා ගන්නවා. තමාගේ පියා පැමිණ සිටිනා බව ජීවාත්මයන් දන්නවා. ඔබ ඒ බ්‍රහ්මාණ්ඩයෙහි පාලකයන් වූ අතර පියාත් එම බ්‍රහ්මාණ්ඩයෙහි (ආලෝක දනව්වෙහි) පාලකයා වනවා. ජීවාත්ම අශාරීරික වන්නා සේ, උත්තරීතර ජීවාත්මයත් අශාරීරිකයි. ඔහුගේ නම උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය යන්නයි, එනම්, සියල්ලටම ඔබ්බෙහි වාසය කරන්නා වූ තැනැත්තා යන්නයි. උත්තරීතර ජීවාත්මය යනු පරමාත්ම දෙවියන්ය. පියාගෙන් ඔබ උරුමය ලබා ගන්නවා. පූජකවරුන්, ශාන්තුවරුන් හෝ මහත්මාවරු මෙහි නැහැ සියල්ලන්ම දරුවන්. ඔවුන් පියාගෙන් අසීමිත වූ උරුමය හිමිකර ගන්නවා. වෙන කිසිම කෙනෙක්ට ඔබට උරුමයක් දිය නොහැකියි. ස්වර්ණමය යුගය ස්ථාපනය කරන්නා වන්නේ පියායි. පියා සැම විටම ඔබට සතුට ලබා දෙනවා. පියා ඔබට සතුට හා දුක දෙනවා කියා දෙයක් මෙහි නැහැ එය නීතිය නොවේ. පියාම විස්තර කර දෙනවා මා දරුවන් වන ඔබට උපත් 21ක් පුරා දේවතාවන් බවට පත්වීමට උත්සාහ දැරිම කරවනවා. එමනිසා, සතුට පිරිනමන්නා වන්නේ ඔහුයි. දුක නැති කර සතුට ලබා දෙන්නා වන්නේ ඔහුයි. ඔබව දුකට පත්කරන්නේ කවුද යන්න ගැන ඔබ දැන් දන්නවා. ඒ තමයි රාවණ්. මෙය හඳුන්වන්නේ පාපකාරී ලෝකය ලෙසයි. පුරුෂයින් හා කාන්තාවන් දෙගොල්ලන්ම පාපයෙන් තොර වූවා. එහි ලක්ෂ්මි හා නාරායන රාජ්‍යය වූවා. එහදී, එම රාජ්‍යය

නීතියට අනුවම පාලනය වෙනවා. ස්වභාව ධර්මයේ මහා භූත ආදිය වැඩ කරන්නේ ඔබගේ විධානයට අනුවයි. එහි කිසිම ව්‍යසනයක් ඇතිවිය නොහැකියි. ඔබ ස්ථාපනය පිළිබඳ වූ දර්ශන දැක තිබෙනවා. විනාශයත් අනිවාර්යෙන්ම සිදුවිය යුතුයි. හෝලි උත්සව තිබෙන විට ඔවුන් සිනා ගන්වන සුළු මුහුණු සාදා, මෙසේ අසනවා මොහුගේ බෙඩන් කුමක් මතු වෙයිද? ඔවුන් පිළිතුරු දෙනවා මිසයිල! නිවැරදි කුමක්ද යන්න ගැන ඔබ දන්නවා. ඔවුන්ගේ විද්‍යාව ඉතාමත් බලවත් වූවකි. එය බුද්ධිය පිළිබඳ වූ දෙයක්. විද්‍යාව පිළිබඳව ඔවුන් බොහෝ ආඩම්බර වෙනවා. ඔවුන් සතුට ලබා ගැනීම සඳහා ගුවන් යානා ආදී නොයෙකුත් දේ සාදා තිබෙනවා. එවිට ඒ දේවල්ම නැවත විනාශය සඳහා මතු වෙනවා. අවසානයේදී ඔවුන් තමාගේ වංශය විනාශ කර දමනවා. ඔබ සූක්ෂම වූ අයයි. ඔබට කිසිම කෙනෙක් සමඟ සටනක් නැහැ. ඔබ කිසිම කෙනෙක්ට දුකක් දෙන්නේ නැහැ. බාබා කියනවා ඔබගේ සිතිවිලි, වචන හා ක්‍රියා මඟින් කිසිම කෙනෙක්ට දුකක් දෙන්න එපා. පියා කිසිම විටෙක කිසිම කෙනෙක්ට දුකක් දෙනවාද? ඔහු ඔබව සතුටේ දේශයේ පාලකයින් බවට පත්කරවනවා. ඔබත් සෑම කෙනෙකුටම සතුට ලබාදිය යුතුයි. බාබා විස්තර කර තිබෙනවා කවුරු කුමක් ඔබට කීවත්, නිහඬව සතුටින්ම සිටින්න. යෝගාවෙහි හිඳිමින් මද සිනහව තබා ගන්න, එවිට ඔවුනුත් ඔබගේ යෝගා බලයෙන් නිහඬ වේවි. ගුරුවරුන්ගේ හැසිරීම ඉතාමත් හොඳ විය යුතුයි කිසිම විටෙක කිසිම කෙනෙක් වෙත හතුරුකමක් පාන්න එපා. පරම පියා කියනවා මට කිසිම කෙනෙක් සමඟ කිසිම හතුරුකමක් නැහැ. සෑම කෙනෙක්ම අපිරිසිඳු බව මා දන්නවා, නමුත්, නාටකය නිර්මාණය වී තිබෙන්නේ ඒ ආකාරයටයි. කෙනෙකුගේ ක්‍රියා කලාපය ඒ අයුරු වන බව මා දන්නවා, ඔහු ගන්නා කෑම බීම ආදිය ඉතාමත් කිලිටියි. එන ඕනෑම දෙයක් ඔවුන් ආහාරයට ගන්නවා. සෑම කෙනෙක්ම ජීවිතයට ආදරය කරනවා. අපත් අපගේ ජීවිතයට බොහෝ ආදරය කරනවා. මේ ජීවිතයේදී අප අනිවාර්යෙන්ම බාබාගෙන් අපගේ උරුමය ලබා ගත යුතු බව අප දන්නවා. යෝගාභී යෙදීමෙන් ඔබගේ ආයු කාලය දීර්ඝ වන අතර ඔබගේ පාපයන් ද අඩු වී යනු ඇත. ඔබගේ අනාගත උපත් 21ක ආයු කාලය ඉතාමත්ම දීර්ඝ වනු ඇත. ඔබ තම තිළිණය නිර්මාණය කර ගැනීම සඳහා උත්සාහයෙහි යෙදෙනවා. යෝගා බලයෙන් අප සෞඛ්‍යමත් වන අතර, ඥානයෙන් ධනවත් වෙනවා. ඔබට සෞඛ්‍යය හා ධනය තිබෙනා තැන සතුටත් තිබෙනවා. ධනය තිබී සුවය නොතිබුණොත්, ඔබට සතුටින් සිටිය නොහැකියි. බොහෝ ධනවත් රජවරුන් සිටියා වුවත් ඔවුන් අංග විකලයි. ඔවුන් කළ පාපකාරී ක්‍රියා නිසා ඔවුන් එහි ඵලය ලැබුවා කියා ඉන් තේරුම් ගත හැකි වෙනවා. පරම පියා ඔබට බොහෝ දේ පවසනවා, කොහොමනමුත්, ඔබ එළියට ගිය සැණින් ඔබ ඇසූ සියලු දේ අමතක වීම නොවිය යුතුයි. ඔබ ඥානය ධාරණය කරගත යුතුයි. වෙන කිසිම දෙයක් සිහි කළ නොහැකි වුවත් ශිව බාබා සිහිපත් කරන්න. ඉතා අදෘෂ්‍යමාන ආකාරයෙන් ඔහුව ප්‍රශංසාවට පත් කරන්න බාබා, ඔබ පැමිණ අපට උගන්වනවා යන්න ගැන මගේ මනසේ හෝ හදවතෙහි තිබුණේ නැහැ. බාබා, දැන් අප දන්නවා. පියාගේ නම වෙනුවට, ඔවුන් ක්‍රිෂ්ණාගේ නම ඇතුල් කර ගීතාව බොරුවක් බවට පත්කරවා තිබෙනවා. එය ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියාවන් විය නොහැකියි. ගීතාව වූ කලී මෙම සංගම් යුගයේ ආගමික ග්‍රන්ථයයි, නමුත් ඔවුන් එය තඹ යුගයට අයත් කරවා තිබෙනවා. පරම පියා කියනවා දරුවනි, අනෙක් සෑම දෙයක්ම අමතක කර දමා ඔබේ ඉගෙනුමට අවධානය යොමු කරන්න. ඔබ පියාගේ ස්මරණයේ සිට මෙම ඥානයෙන් කුල්මත් නොවුණහොත්, එය අපතේ හැරීමකි. ඔබගේ කාලය ඉතාමත් වටිනවා, එමනිසා, කිසි විටෙක ඔබ එය අපතේ නොහැරිය යුතුයි. ඔබ ජීවත්වීමට ඉපැයිය යුතුයි, නමුත්, නිෂ්ඵල සිතිවිලිවලට ඔබ තම වටිනා කාලය අපතේ නොහැරිය යුතුයි. ඔබගේ සෑම තත්පරයක්ම දියමන්තියක් සේ වටිනා වූවකි. පරම පියා කියනවා මන්මනාභව්! ඒ සඳහා වැය කරන කාලය පමණයි ප්‍රයෝජනවත් වන්නේ, අනෙක් සෑම දෙයකටම යොදවන කාලය අපතේ හැරීමක් පමණයි. ඔබ කෙතරම් දුරට කාලය අපතේ හැරියාද යන්න ගැන වාර්තාවක් තබා ගන්න. එය එක වචනයයි 'මන්මනාභව්'. කල්ප බාගයක් පුරා ඔබ බන්ධන මුක්ත වූ අතර, කල්ප බාගයක් පුරා බන්ධනයෙන් යුක්ත වූවා. ඔබ සතෝප්‍රධාන් තත්ත්වයේ සිටි අතර පසුව සතෝ, රජෝ හා තමෝ යන තත්ත්වයන් සියල්ලක්ම ඔබ පසු කළා. අප ජීවන මුක්ති තත්ත්වයට පත්වෙමින් සිටිනවා. අපව එම තත්ත්වයට පත් කරවන කෙනා වන්නේ පරම පියායි. සෑම කෙනෙක්ම ජීවන මුක්තිය ලබනවා. තමාගේ ධර්මය අනුව, ඔවුන් පළමුව සතුට අත්දකිනා අතර, පසුව දුක අත්විඳිනවා. පළමුවෙන්ම අලුත්වටම එන ජීවාත්ම පළමුවෙන්ම සතුට අත්විඳිනවා. සමහර අලුත්ම ජීවාත්ම ඔවුන්ගේ එම ශක්තිය නිසා ඔවුන් බොහෝ සෙයින් ප්‍රශංසාවට ලක් වෙනවා. ඔබගේ ඇතුලාන්තයෙහි සතුටේ සීනු නාද විය යුතුයි. මන්ද, අප බාප්දාදා ඉදිරියේම අසුන්ගෙන සිටිනවා. ඒ නව නිර්මාණය දැන් නිර්මාණය වෙමින් පවතිනවා. ඔබ දැන් ප්‍රශංසාවට පත්වෙන ප්‍රමාණය සත් යුගයේදී ප්‍රශංසාවට පත්වන ප්‍රමාණයට වඩා ඉහළයි. ජගත් මාතාව (ජගදම්බා) සහ දේවතාවියන් සිටියේ සංගම් යුගයේයි. බ්‍රහ්මිණ්වරුන් ද සිටියා. අප දැන් බ්‍රහ්මිණ්වරුන් වන අතර පසුව වන්දනීයත්වයට සුදුසු දේවතාවන්

වන බව ඔබ දන්නවා. ඔබගේ සිහිවටනයන්හී කෝවිල් නිර්මාණය කර තිබෙනවා. ඔබ සජීවී දේවී දේවතාවන් බවට පත්වෙනවා ඒවා අජීවී ප්‍රතිමාවන්ය. ඔවුන්ගෙන් අහන්න මේ කෙනා දේවතාවක් වූයේ කෙසේද? කෙනෙක් ඔබට කතා කළහොත්, ඔවුන්ට පැහැදිලි කර කියන්න අප බ්‍රහ්මිණ්වරුන් වූ අතර පසුව දේවී දේවතාවන් බවට පත්වූවා. ඔබ ඉන්නේ ඔබගේ සජීවී ස්වරූපයෙනුයි. මෙම ඥානය පළමු පන්තියේ වූවක් බව ඔබ කියනවා. ඔබ සත්‍ය ලෙසම ස්ථාපනය කරගෙන යනවා. දරුවන් කියනවා බාබා, අප ලක්ෂ්මී හා නාරායනට වඩා වූ පහත් තත්ත්වයක් හිමිකර ගන්නේ නැහැ අපි අපගේ සම්පූර්ණ උරුමයම ලබා ගන්නවා. මේ පාසල මේ ආකාරයි, ඔබ සැම කෙනෙක්ම කියනවා අප පැමිණ සිටින්නේ පෞරාණික රාජයෝගාව ඉගෙන ගැනීමටයි. යෝගා මඟින් ඔබ දේවී දේවතාවන් බවට පත්වනවා. ඔබ දැන් ශුද්‍ර තත්ත්වයෙන් බ්‍රහ්මිණ්වරුන් බවටත්, පසුව, බ්‍රහ්මිණ්වරුන්ගෙන් දේවතාවන් බවටත් පත්වනවා. ප්‍රධාන දෙය ස්මරණයයි. ස්මරණයේදී තමයි මායා ඔබට බාධක පමුණුවන්නේ. ඔබ බොහෝ උත්සාහ දරණවා, නමුත්, තවමත් ඔබගේ බුද්ධිය එහෙ මෙහෙ යනවා. මේ සඳහා තමයි සියලු උත්සාහයන් අවශ්‍ය වන්නේ. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා මෙන් සතුට පිරිනමන්නෙක් වන්න. ඔබගේ සිතිවිලි, වචන හෝ ක්‍රියා තුළින් කිසිම කෙනෙකුට දුක් දෙන්න එපා. ඔබව සාමයෙන් පුරවාගෙන සතුටින් ගත කරන්න.
2. අනවශ්‍ය සිතිවිලිවලට ඔබගේ කාලය අපතේ හරින්න එපා. තම ඇතුලාන්තයෙන්ම පියාට ප්‍රශංසා කරන්න.

**වරදානය:** ඔබ ඕනෑම කර්ම බන්ධනයකින් නිදහස් වී උසස් මඟ පෙන්වීම් අනුව සෑම ක්‍රියාවම කර්ම යෝගීවරයෙකු විලසින් සිදුකරන්න.

උසස් මඟපෙන්වීම් අනුව සෑම ක්‍රියාවක්ම කරනා දරුවන්ට අසීමිත ආධ්‍යාත්මික කුල්මත්භාවයක් තිබේ. ක්‍රියාවක් කරන අතරේ කර්ම බන්ධන කිසිවකට ඔවුන් ආකර්ෂණය වන්නේ නැත; ඔවුන් නොබැඳිව සහ ළබැඳිව සිටිති. කර්ම යෝගීවරයෙකු විලස කරන ක්‍රියාවන් මඟින් ඔවුන්ට දුක් රළ පැමිණිය නොහැක: ඔවුන් නිරන්තරව නොබැඳිව සහ ළබැඳිව සිටිති. මොනම කර්ම බන්ධනයකටවත් ඔවුන්ව ඇදිය නොහැක. ඔවුන් සැම විටම පාලකවරුන් විලස ක්‍රියා කරති. ඔවුන් මොනම කර්ම බන්ධන වලිනුත් නිදහස් වූ තත්ත්වයක් අත්විඳින්නේ එම නිසායි. එවන් ජීවාත්මයන් නිරන්තර සතුට තමනුත් අත්විඳ අන් අයටත් සතුට ලබා දෙති.

**පාඨය:** අත්දැකීම් වල අධිකාරියෙකු වන්න. එවිට ඔබ කිසිදා නොරැවටෙනු ඇත.

***** ඕම ශාන්ති *****